# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,417 - 2024 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2024.12.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : II (ආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 3186 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... | 3191 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජනවාරි මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජනවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2024 දෙසැම්බර් මස 25 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**දීපා නිලන්ති ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ*).

මෙම ගැසට් පත්‍රය <u>*www.documents.gov.lk*</u> වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - කෑගල්ල

කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ වර්ෂ **2025** ක් වූ ජනවාරි මස **17** වන දින ප.ව. **1.00** ට කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුයි.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය පැවැත්වෙන දින ප.ව. 12.30 - ප.ව. 1.00 තෙක් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය මගින් ඉදිරිපත් කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතුය.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ එදිනම **ප.ව. 4.00** ට පෙර මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන පුද්ගලයින් ස්වකීය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - කෑගල්ල.

2024 දෙසැම්බර් මස 11 වැනි දින,
කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

| *අනු. අංකය* | *නඩු අංකය* | *විස්තරය* | *වෙනත්* |
|---|---|---|---|
| 01 | 20350/18 | i. ලිට්රෝ ගෑස් සිලින්ඩර 01 (12.5kg)<br>ii. වට දහර 02 ගෑස් ලිප් 01 | |
| 02 | 39070/24 | i. ලාෆ් ගෑස් සිලින්ඩරය (5kg)<br>ii. ඇලුමිනියම් මුට්ටි 02<br>iii. ප්ලාස්ටික් බේසම් 01 | |
| 03 | 33994/24 | ලිට්රෝ ගෑස් සිලින්ඩර 01 (12.5kg) | |
| 04 | 34858/24 | i. වට දහර 03 ලිප් 01<br>ii. ලාෆ් ගෑස් සිලින්ඩරය (12.5kg) | |
| 05 | 32277/PE/24 | i. ඇලුමිනියම් මුට්ටි 01<br>ii. සිදුරක් සහිත ඇලුමිනියම්කළ 01 | |

| *අනු. අංකය* | *නඩු අංකය* | *විස්තරය* | *වෙනත්* |
|---|---|---|---|
| 06 | 35398/PE/20 | i. රෙගියුලේටරය සවිකරන ලද වට 02 ගෑස් ලිප් 01<br>ii. ඇලුමිනියම් මුට්ටි 01<br>iii. සිදුරක් සහිත මුට්ටි 01 | |
| 07 | 35504/PE/24 | i. ඇලුමිනියම් මුට්ටි 01<br>ii. ඇලුමිනියම් හිල් මුට්ටි 01<br>iii. ප්ලාස්ටික් බේසම් 01 | |
| 08 | 32187/PE/24 | i. ඇලුමිනියම් මුට්ටි 01<br>ii. සිදුරු ඇලුමිනියම් මුට්ටි 01<br>iii. යකඩ බැරල් 01 | |
| 09 | 23185/PE/24 | i. හිල් ඇලුමිනියම් වළං 01<br>ii. ඇලුමිනියම් වළං 01 | |
| 10 | 39231/D/24 | i. ජංගම දුරකථන Charger 01 | |
| 11 | 37711/PE/24 | i. ඇලුමිනියම් මුට්ටි 01<br>ii. හිල් ඇලුමිනියම් මුට්ටි 01 | |
| 12 | 30561/24 | i. ලිට්‍රෝ ගෑස් සිලින්ඩර 01 (12.5kg)<br>ii. වට දහර 02 ලිප් 01 | |
| 13 | B/4320/23 | UX - 3945 දරන CT 100 බජාජ් මෝටර් සයිකලය වාහනයක් ලෙස | |

12 - 353

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - කන්තලේ**

2024.12.30 වැනි දින හා 2024.12.31 වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ වෙන්දේසි 2024 වර්ෂයේ ගිණුම් කටයුතු අවසන් කිරීම හේතුවෙන් පැවැත්වීමට නොහැකි වූ බැවින්,

2024.12.30 වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ වෙන්දේසිය **2025.01.18** වැනි දින හා

2024.12.31 වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ වෙන්දේසිය **2025.01.25** වැනි දින පැවැත්වීමට නියමිත බව මෙයින් දන්වා සිටිමි.

ජී. පී. බී. සඳරේඛා,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත් - කන්තලේ.

2024 දෙසැම්බර් මස 24 වැනි දින,
කන්තලේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

12 - 423

**මහෙස්ත්‍රාත් අධිකරණය - මීගමුව**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ රාජසන්තක වූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2025 - 01

මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය භාරයට පත් රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත සඳහන් අබලි හා නඩු අංක රහිත භාණ්ඩ **2025.01.11** වැනි දින **පෙ.ව. 9.45** ට මීගමුව අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් කියන අයෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ වෙන්දේසිය පැවැත්වෙන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත්කළ යුතුයි.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ නිසි අවසරය ලබාගෙන වෙන්දේසිය පැවැත්වීමට පැය භාගයකට පෙර භාණ්ඩ පරීක්ෂා කළ හැක.

04. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන භාණ්ඩයන් සඳහා ඉල්ලුම්කරු විසින් වෙන්දේසි අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතුය. මේ සඳහා චෙක්පත් භාරගනු නොලබන අතර මිල දී ගත් භාණ්ඩ එදින ම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

05. වෙන්දේසි භූමියට පැමිණෙන අය තම අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරිපත් කිරීමට නොහැකි වන්නන් හට වෙන්දේසි භූමියට ඇතුල්වීමට අවසර දෙනු නොලැබේ.

06. අධිකරණය විසින් කරනු ලබන ලන්සුව නොපිළිගන්නා අවස්ථාවක දී ගරු අධිකරණයේ අභිමතය පරිදි වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ භාණ්ඩ ඉවත් කර ගැනීම හා වෙන්දේසිය අවලංගු කිරීමේ බලය අධිකරණය සතුය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - මීගමුව.

2024 දෙසැම්බර් මස 19 වැනි දින,
මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *විස්තරය* | |
|---|---|---|
| 01 | 28 ශ්‍රී 4616 අබලි ටිපර් රථය | |
| 02 | 41-8972 | අබලි යතුරු පැදි |
| 03 | WPMM 7488 | |
| 04 | WPHC 9622 | |
| 05 | WPGO 0119 | |
| 06 | WPXP 3115 | |
| 07 | 93 ශ්‍රී 9818 | |
| 08 | WPMF 0570 | |
| 09 | WPUL 3674 | |
| 10 | WPHE 5221 | |
| 11 | WPGU 0041 | |

| *අනු. අංකය* | *විස්තරය* |
|---|---|
| 12 | WPXG 7325 |
| 13 | 150-1584 |
| 14 | NWGS 1729 } අබලි යතුරු පැදි |
| 15 | MN 8245 |
| 16 | GK 7771 |
| 17 | කලපු ඔරු 01 |
| 18 | බෝට්ටු 01 |
| 19 | තෙප්පමු 01 |
| 20 | බෝට්ටු 01 |
| 21 | බෝට්ටු 01 |
| 22 | බෝට්ටු 01 |
| 23 | බෝට්ටු 01 |
| 24 | බෝට්ටු 01 |
| 25 | බෝට්ටු 01 |
| 26 | බෝට්ටු 01 |
| 27 | බෝට්ටු 01 |
| 28 | බෝට්ටු 01 |
| 29 | ලැප්ටොප් 01 ඒ ආර් 2945/23 |
| 30 | දූරකථන 01 ඒ ආර් 2944/23 |
| 31 | CPU 06<br>MONITOR 02 } අබලි<br>KEY BOARD 04 |
| 32 | කම්ප්‍රෙෂර් (ශීතකරණයක) 01 |
| 33 | ස්ටාටර් මෝටර් 01 |
| 34 | මහන මැෂින් මෝටර් 01 |
| 35 | අබලි ඉලෙක්ට්‍රොනික් කොටස් |
| 36 | අබලි යකඩ කෑබලි |
| 37 | අබලි තරාදි කොටස් |
| 38 | අබලි ප්ලාස්ටික් බඩු (කැඩී ගිය කොටස්)<br>බ්‍රීෆ්කේස් 01 |
| 39 | රිම් 01 ස්ටාටර් මෝටර් 01 යකඩ පුලි 01 |
| 40 | ප්ලාස්ටික් බැරල් 15 |
| 41 | ඇලුමිනියම් මුට්ටි 10 |
| 42 | වීදුරු බෝතල් තොගය |
| 43 | ප්ලාස්ටික් බුලි (ලොකු) 20 |
| 44 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 45 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |

| *අනු. අංකය* | *විස්තරය* |
|---|---|
| 46 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 47 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 48 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 49 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 50 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 51 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 52 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 53 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 54 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 55 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 56 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 57 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 58 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 59 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 60 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 61 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 62 | ට්‍රැවලින් බෑග් (ලොකු) 01 |
| 63 | ට්‍රැවලින් බෑග්(ලොකු) 01 |
| 64 | ට්‍රැවලින් බෑග් (කුඩා) 01 |
| 65 | ට්‍රැවලින් බෑග් (කුඩා) 01 |
| 66 | ට්‍රැවලින් බෑග් (කුඩා) 01 |
| 67 | ට්‍රැවලින් බෑග් (කුඩා) 01 |
| 68 | ට්‍රැවලින් බෑග් (කුඩා) 01 |
| 69 | ට්‍රැවලින් බෑග් (කුඩා) 01 |
| 70 | ට්‍රැවලින් බෑග් (කුඩා) 01 |
| 71 | ට්‍රැවලින් බෑග් (කුඩා) 01 |
| 72 | ට්‍රැවලින් බෑග් (කුඩා) 01 |
| 73 | ට්‍රැවලින් බෑග් (කුඩා) 01 |
| 74 | බොරළු පස් කියුබ් 5 (1 x 1500) |
| 75 | ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් 01 (12.5 kg) |
| 76 | ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් 01 (12.5 kg) |
| 77 | 10085 - යකඩ බැරල් 01<br>නිල් පාට ප්ලාස්ටික් බැරල් 11 |
| 78 | ප්ලාස්ටික් බෝතල් තොගය |
| 79 | හාල් 40 kg (එකක මිල 200/-) |

# රජයේ නොවන දැන්වීම්

**සීමාසහිත මන්ස්රම් (සිලෝන්) (පුද්ගලික) සමාගම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 59 (2) වගන්තිය යටතේ සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීම පිළිබඳ මහජනයා වෙත කෙරෙන දැනුම් දීමයි.

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | සීමාසහිත මන්ස්රම් (සිලෝන්) (පුද්ගලික) සමාගම |
| සමාගම් ලියාපදිංචි අංකය | : | PV 17746 |
| සමාගමේ ලියාපදිංචි ලිපිනය | : | අංක 25, රයින්ලන්ඩ් පෙදෙස, කොළඹ 03. |
| අඩු කිරීමට පෙර ප්‍රකාශිත ප්‍රාග්ධනය | : | රු. 208,000 කි |
| අඩු කිරීම අනුව ප්‍රකාශිත ප්‍රාග්ධනය | : | රු. 40 |
| අඩු කිරීමේ ප්‍රමාණය | : | රු. 207,960 |

D S Corporate Services (Private) Limited.
සමාගම් ලේකම්වරු.

අංක 302 A, රයිගම, බණ්ඩාරගම.

12 - 322

---

**සමාගම් ලියාපදිංචි අංක PV 84551 දරන සෙරන්ඩිබ් ප්‍රොපර්ටීස් ලංකා (පෞද්ගලික) ලිමිටඩ් "සමාගමේ" හි ප්‍රකාශිත ප්‍රාග්ධනය**

සමාගම් පනතේ 59(2) 2007 අංක 07 වගන්තිය යටතේ මහජන දැනුම් දීමයි

ශ්‍රී ලංකා රුපියල් තුන්සිය පනස් තුන් මිලියන දෙසිය විසි දහස් පන්සිය (රු. 353,220,500.00) සිට ශ්‍රී ලංකා රුපියල් දෙසිය තුන් මිලියන දෙසිය විසි දහස් පන්සිය (රු. 203,220,500.00) දක්වා අඩු කිරීමක් පිළිබඳව මහජන දැනුම්දීම මෙයින් සිදු කෙරේ.

ඉහත සඳහන් කළ යෝජිත ප්‍රාග්ධනය අඩු කිරීම සම්බන්ධයෙන් සලකා බලා තීරණයක් ගැනීම සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය එවැනි කොටස් හිමියන් සඳහා සමාගමේ කොටස් හිමියන්ගේ රැස්වීමක් කැඳවනු ඇත.

මණ්ඩලයේ නියෝගය අනුව,

සීමාසහිත සෙරන්ඩිබ් ප්‍රොපර්ටීස් ලංකා (පුද්ගලික),
Spillburg Holdings (Pvt) Ltd,
ලේකම්වරු.

2024 නොවැම්බර් මස 30 වැනි දින.

12 - 343

---

**බ්ලූ ස්ටාර් රියල්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

යෝජිත ප්‍රකාශිත ප්‍රාග්ධනය අවකරණය කිරීම

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතෙහි 17 වගන්තිය යටතේ ස්ථාපිත කළ සමාගමක් වන බ්ලූ ස්ටාර් රියල්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි කොටස්හිමියන් විසින්, සමාගමේ කොටස් හිමිකාරිත්වය අවකරණය කිරීම සඳහා තම එකඟතාව ප්‍රකාශ කොට ඇති අතර, 2007 අංක 07 දරන සමාගම් පනතෙහි විධිවිධානවලට හා අනෙකුත් නීතිරීතිවලට අනුකූල වෙමින් සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය අවකරණය කිරීම සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කොට ඇත. ඒ අනුව,

බ්ලූ ස්ටාර් රියල්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ (සමාගම) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පූර්ණ ලෙස ගෙවූ සාමාන්‍ය කොටස් මගින් නියෝජනය වන සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය වන රුපියල් 100,150,000.00 ප්‍රමාණය පූර්ණ ලෙස ගෙවූ සාමාන්‍ය කොටස් 200,600,000 මගින් නියෝජනය වන පරිදි රුපියල් 1,000.00 දක්වා අවකරණය කිරීම, සඳහා 2007 අංක 07 දරන සමාගම් පනතේ 59 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, තම කොටස් හිමියන් වෙත මෙම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවකරණ නිවේදනය **මෙයින් දැනුම් දෙනු ලැබේ.**

ඉහත අවකරණය සමාගමේ පූර්ණ ලෙස ගෙවූ හා නිකුත් කළ සාමාන්‍ය කොටස් ඉතිරි ප්‍රමාණයට බලපෑමක් සිදු නොවන පරිදි ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් 100,149,000.00 ප්‍රමාණයට එදිරිව ගෙවීම් සිදු කිරීමෙන් සිදු කරනු ඇත.

යෝජිත ප්‍රකාශිත ප්‍රාග්ධනය අවකරණය කිරීම සඳහා විශේෂ සහා සම්මතයක් ලෙස කොටස්හිමියන් වෙතින් අනුකූලතාවය ලබා ගැනීම සඳහා දින 60 ක දැනුම්දීමකින් පසුව සමාගමේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් කැඳවීම සඳහා කටයුතු කෙරේ.

ඇසයින්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
බ්ලූ ස්ටාර් රියල්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ලේකම්වරු.

2024 දෙසැම්බර් මස 19 වැනි දින.
අංක 200/1/1, උද්‍යාන පටුමග,
ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

12 - 367

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

### සමාගම, පොදු සීමිත සමාගමක් බවට පරිවර්තනය කිරීම

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කොළඹ 06, දොස්තර ඊ. ඒ. කුරේ මාවත, අංක 18/3 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි මහරාජා ෆුඩ්ස් ලිමිටඩ් (සමාගම් අංකය පීබී 00296080) 2024 සැප්තැම්බර් 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි 2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව පොදු සීමිත සමාගමක් (පීඑල්සී) බවට පරිවර්තනය කළ බව මෙසේ දැනුම් දෙනු ලැබේ. සමාගම, එහි නාමය ද මහරාජා ෆුඩ්ස් පීඑල්සී සහ ලියාපදිංචි අංකය පීකිව් 00296080 ලෙස ද වෙනස් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 09, 3 වන මහල,
පාසැල් පටුමග,
කොළඹ 03.

12 - 406/1

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

### සමාගම පොදු සමාගමක් බවට පරිවර්තනය කිරීම

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කොළඹ 06, දොස්තර ඊ. ඒ. කුරේ මාවත, අංක 18/3 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි මහරාජා ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංකය පීවී 89705) 2024 මාර්තු 06 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි 2007

අංක 7 දරන සමාගම් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව පොදු සමාගමක් බවට පරිවර්තනය කළ බව මෙසේ දැනුම් දෙනු ලැබේ. සමාගම, එහි නාමය මහරාජා ෆුඩ්ස් ලිමිටඩ් සහ ලියාපදිංචි අංකය පීබී 00296080 ලෙස ද වෙනස් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 09, 3 වන මහල,
පාසැල් පටුමග,
කොළඹ 03.

12 - 406/2

---

**2024 සැප්තැම්බර් 18 දිනැති නිවේදනය සඳහා සංශෝධනය**

1995 ජුනි 16 දිනැතිව අංක 875/9 දරන *අති විශේෂ ගැසට්* නිවේදනය මගින් *ගැසට්* කළ හා 2003 ජූලි 29 දිනැති අංක 1299/6 දරන අති *විශෙෂ ගැසට්* නිවේදනය මගින් සංශෝධිත සමාගම් පවරා ගැනීම් හා ඒකාබද්ධ කිරීම් සංග්‍රහය 1995 (2003 වර්ෂයේ සංශෝධිත) යටතේ කරනු ලබන දැන්වීමයි

**සියරා කේබල්ස් පීඑල්සී ආයතනය සතු සාමාන්‍ය ඡන්ද හිමි කොටස් 373,991,364 ක ප්‍රමාණයක් මිල දී ගැනීම සඳහා අයිකනික් ට්‍රස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී සමාගමේ පූර්ණ අයිතිය සතු පරිපාලිත සමාගමකි) විසින් කරනු ලබන අනිවාර්ය අර්පණය.**

1. **අර්පණය සඳහා පසුබිම :**

සමාගම් ලියාපදිංචි අංක පීවී 00232531 දරන, රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 100/1, තම ලියාපදිංචි කාර්යාලය පිහිටි අයිකනික් ට්‍රස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (මින් මතුවට අර්පණකරු ලෙස හැඳින්වේ) (බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී ආයතනයේ පූර්ණ අයිතිය සතු පරිපාලිත සමාගමකි) ආයතනය විසින් සියරා කේබල්ස් පීඑල්සී (මින් මතුවට අර්පණලාභියා ලෙස හැඳින්වේ) සමාගමට අයත් අර්පණලාභියා සතු නිකුත් කළ සාමාන්‍ය ඡන්ද හිමි කොටස් 6,654,899 ක්, (අර්පණලාභියා සතු නිකුත් කළ මුළු කොටස් ප්‍රමාණයෙන් 1.24% වන අතර, කොටසක මිල රුපියල් 8.00 වේ) පවත්නා කොටස් 156,866,167 සමග (අර්පණලාභියා සතු මුළු කොටස් සංඛ්‍යාවෙන් 29.18% වේ), 2024 සැප්තැම්බර් 11 දින කොළඹ කොටස් වෙළඳපොළෙහි තැරැව් භූමියේ දී පවරා ගැනීම හේතුවෙන් පවත්නා අර්පණලාභියාගේ මුළු කොටස් ප්‍රමාණය 30.42% (මුළු කොටස් ප්‍රමාණය 163,521,066) වේ.

අර්පණකරු විසින්, සංශෝධිත 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතෙහි 53 වගන්තිය යටතේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් සකස් කළ නියමයන් යටතේ ප්‍රකාශිත සමාගම් පවරාගැනීම් හා ඒකාබද්ධ කිරීම් සංග්‍රහය 1995 (සංශෝධිත) (සංග්‍රහය) ප්‍රකාරව (පහතින් සඳහන් පරිදි) සංග්‍රහයේ නියමය 31(1)(ඒ)(අ) අනුව තැරැව් භූමියේ දී සිදු කළ ක්‍රියාරම්භකය හේතුවෙන් අනිවාර්ය අර්පණයක් සිදුකළ යුතු වේ.

**අර්පණකරුගේ අධ්‍යක්ෂවරයෙකු වන එම් . ඒ. පී. එන්. වීරසිංහ මහතා (අර්පණලාභියාගේ ද අධ්‍යක්ෂවරයෙක් වේ), ඔහු අර්පණකරුගේ හා අර්පණලාභියාගේ අධ්‍යක්ෂවරයෙකු වීමට පෙර 2020 දෙසැම්බර් දී හා 2021 ජනවාරි දී අර්පණලාභියාගේ ආසන්න වශයෙන් 0.01% ඇතුළත් කොටස් 60,000 ක් අත්පත් කරගන්නා ලදී. 2021 ජනවාරි 25 වැනි දින ඔහු අර්පණකරුගේ අධ්‍යක්ෂවරයෙකු වූ අතර, 2022 පෙබරවාරි 11 වැනි දින අර්පණලාභියාගේ අධ්‍යක්ෂවරයෙකු විය.**

**ඒ අනුව අර්පණකරු සහ අර්පණලාභියා සමග හවුලේ ක්‍රියා කරන පාර්ශ්ව කොටස් 163,581,066 දරන අතර, එය අර්පණලාභියාගේ නිකුතුවේ ඇතුළත් 30.43% කොටස් ප්‍රමාණයකි.**

සංග්‍රහයේ නියමය 31 (1) (ඒ) හි මෙසේ සඳහන් වේ ;

"යම් පුද්ගලයෙකු විසින්, කිසියම් කාලයක් තුළ ගනුදෙනු කිහිපයක දී හෝ වෙනයම් ආකාරයකින්, එම පුද්ගලයා සමග හවුලේ ක්‍රියාකරමින් යම් අයවලුන් විසින් තමන් සතු හෝ ලබාගත් කොටස් සමග ගෙන සමාගමේ ඡන්ද අයිතිය සියයට තිහකට හෝ ඊට වැඩි ප්‍රමාණයක් පවරා ගත් කළ ; එවන් අයකු විසින්, දින තිස් පහක් ඇතුළත අදාළ නියමය ප්‍රකාරව, කොටස් අයිතිය සතු

අනෙකුත් පුද්ගලයන් හා එක්ව ඕනෑම පංතියක ඡන්ද හිමි සාමාන්‍ය කොටස් හිමිකරුවන් හට අර්පණයක් ඉදිරිපත් කළ යුතු වේ".

ඒ අනුව, අර්පණකරුහට, අර්පණලාභියා සතු, දළ වශයෙන් සාමාන්‍ය ඡන්ද හිමි කොටස්වලින් 69.57% සමන්විත, ඉතිරි කොටස් හිමියන් සතු සාමාන්‍ය ඡන්දහිමි කොටස් 373,991,364 කොටසක් රුපියල් 8.00 බැගින් මිල දී ගැනීම කළ යුතු වේ.

2024 සැප්තැම්බර් 11 දිනට පෙර පූර්වාසන්න වසරක කාලයක් තුළ අර්පණලාභියාගේ එක් සාමාන්‍ය ඡන්දහිමි කොටසක් සඳහා ගෙවන ලද වැඩිම මිල රුපියල් 8.00 වේ.

**2. අර්පණයේ නියමයන් :**

ඒ අනුව අර්පණකරු විසින්, අර්පණලාභියාගේ කොටස්හිමියන් සතු ඉතිරි සාමාන්‍ය ඡන්දහිමි කොටස් 373,991,364 ප්‍රමාණය, කොටසක් රුපියල් 8.00 බැගින් මිලට ගැනීම සඳහා අර්පණ ඉදිරිපත් කරයි. මෙම ගෙවනු ලබන මුදල, අර්පණලාභියාගේ එක් කොටසක් සඳහා, 2023 සැප්තැම්බර් 09 දින හා 2024 සැප්තැම්බර් 10 දින අතර කාලය තුළ අර්පණකරු විසින් ගෙවන ලද ඉහළම මුදල වේ.

අර්පණකරු විසින් සිදු කිරීමට අපේක්ෂිත මෙම අර්පණය, අදාළ අර්පණයේ අවසන් වන විට අර්පණලාභියාගේ ලියාපදිංචි පොත්වල සඳහන් සාමාන්‍ය ඡන්දහිමි කොටස්හිමියන් සියලු දෙනාහට විවෘතය.

**3. අර්පණකරුගේ අනන්‍යතාව :**

අර්පණකරු, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2020 දෙසැම්බර් 30 දින සීමිත වගකීම් සමාගමක් ලෙස සංස්ථාගත කොට ඇති අතර, බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී සමාගමේ පූර්ණ අයිතිය සතු පරිපාලන සමාගමක් වේ.

අර්පණකරුගේ ලියාපදිංචි කාර්යාලය, රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 100/1 හි පිහිටා ඇත.

අර්පණකරුගේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේය :

ඩී. එස්. කේ. අමරසේකර මහතා
කේ. ඒ. කේ. ජී. ගුණවර්ධන මහතා
ටී. ජී. එස්. එස්. කොටකදෙනිය මහතා
එම්. ඒ. පී. එන්. වීරසිංහ මහතා

අර්පණකරුගේ ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය ඡන්දහිමි කොටස් 01 ක් නියෝජනය කරමින් රුපියල් 10/- බැගින් වේ.

අර්පණකරුගේ ප්‍රධානතම ක්‍රියාකාරකම් වශයෙන් උපායමාර්ගික ආයෝජන සම්බන්ධ පරිපාලන සමාගමක් ලෙස කටයුතු කෙරේ. සියරා කේබල්ස් පීඑල්සී සමාගමෙහි පවත්නා කොටස්වලට අමතරව, අර්පණකරු, බ්‍රවුන්ස් ඩිවලොප්මන්ට් ලිමිටඩ් (කලින් සියරා ඩිවලොප්මන්ට් ලිමිටඩ් ලෙස පැවති) සමාගමේ හා සැන්සුන් බුටික් හොටේල්ස් ලිමිටඩ් යන සමාගම්වල සමස්ත කොටස්හිමි ආයතනය වේ.

**4. අර්පණලාභී සමාගමේ පවත්නා කොටස් හිමිකාරීත්වය :**

(aa) අර්පණකරු සතු හෝ අර්පණකරු වෙත පාලිත බලය හිමි අර්පණලාභියා වෙත පවත්නා අර්පණලාභී කොටස් ප්‍රමාණය : 163,521,066
(bb) අර්පණලාභියා වෙත පවත්නා, අර්පණකරුගේ හවුල්කාරත්වයෙන් යුත් ඕනෑම අයකු සතු හෝ පාලිත බලය සතු කොටස් ප්‍රමාණය : 60,000
(cc) ඕනෑම කොටස්හිමියකු වෙතින්, අර්පණකරුහට, අදාළ අර්පණය පිළිගන්නා ලෙසට කටයුතු කිරීමට අදාළව වන අර්පණලාභී කොටස් ප්‍රමාණය : නැත

**5. අර්පණය සඳහා කොන්දේසි :**

ඉහතින් සඳහන් පරිදි, අර්පණලාභියාගේ මුළු කොටස් තැන්පතු ප්‍රමාණයෙන් 30.43% වූ කොටස් හිමිකාරීත්වය 163,521,066 ක් වේ. අදාළ සංග්‍රහයේ නියමය 31(2) ප්‍රකාරව, නියමය 31 යටතේ සිදුකළ අර්පණයක් කොන්දේසි සහිත වනුයේ, අර්පණකරු වෙත අර්පණ කාලය තුළ හෝ එයට පෙර පවරාගත් හෝ පවරා ගැනීමට එකඟවූ කොටස් සමග එකඟතාවයක් ලද කොටස්,

ඡන්ද හිමි කොටස් ප්‍රමාණයෙන් සියයට පනහක් (50%) ඉක්මවා ගියහොත් පමණි.

"පිළිගැනීම කොන්දේසි විරහිතය" යන්නෙහි අර්ථය "අර්පණකරු විසින් අර්පණ මිල ගණන් සඳහා ඉදිරිපත් කළ සියලුම කොටස් භාරගෙන ගෙවීම් කළ යුතු අතර, අර්පණලාභියාගේ කොටස් ආපසු ගැනීමේ අයිතිය අහිමිවේ."

ඒ අනුව, අර්පණකරු විසින් ඕනෑම ලැබෙන වලංගු පිළිගැනීමක්, එකඟතාවක් නොලැබුන ද භාරගෙන මුදල් ගෙවීමට එකඟවන අතර, එහි ප්‍රතිඵලයක් ලෙසට අර්පණකරු වෙත ඡන්දහිමි කොටස් 50% කට වඩා සතුකර ගැනීමට අවස්ථාව ලැබේ.

කොටස්හිමියෙකු විසින් 'පිළිගැනීම' යනුවෙන් අදහස් කරනුයේ අර්පණ ලේඛනයෙහි යොමු කළ අයිතම 6 හි සඳහන් ක්‍රියාපටිපාටියට අනුගත වීම පිළිගැනීමක් වේ යන්නය.

6. අර්පණය සම්බන්ධ වැඩිදුර තොරතුරු :

අදාළ සමාගම් පවරාගැනීම් හා ඒකාබද්ධ කිරීම් සංග්‍රහය අනුගාමීව, අර්පණය විවෘතව පවත්නා කාලය ද ඇතුළත්ව අනෙකුත් අදාළ විස්තර සහිත විස්තරාත්මක අනිවාර්ය අර්පණ ලේඛනයක්, අදාළ අනිවාර්ය අර්පණය සිදු කිරීමට නියමිත දිනයේ සිට දින තිස්පහක් (35) ඇතුළත සියලුම අර්පණලාභියාගේ කොටස්හිමියන් වෙත ලැබීමට සලස්වනු ඇත.

යම් එවන් කොටස්හිමියකු හට, තැපැල් ප්‍රමාදයන් හෝ වෙනත් කරුණක් හේතුවෙන් අදාළ අනිවාර්ය අර්පණ ලේඛනයේ පිටපතක් නොලැබුණිනම්, ඔවුන්හට, එහි පිටපතක් අර්පණයේ රෙජිස්ට්‍රාර්වරුන් වන කොළඹ 03, ගාලු පාරේ, අංක 546/7, එස්එස්පී කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයෙන් පැමිණ ලබාගන්නා ලෙසට උපදෙස් දෙනු ලැබේ.
දුරකථනය : 011 2573485/011 2574798, ෆැක්ස් : 011 2573037

අර්පණකරුගේ අධ්‍යක්ෂවරුන් විසින්, මෙම දැන්වීම දුටු බවත්, ඔවුන් විසින් එය අනුමත කළ බවත්, ප්‍රකාශ කොට සහතික කරනු ලබන අතර, මෙම දැනුම්දීමෙහි සඳහන් තොරතුරුවල නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය සම්බන්ධයෙන් සියලු වගකීම් සාමූහිකව හා පෞද්ගලික වශයෙන් භාරගනු ලබන බවත්, මෙහි නොමග යවනසුළු කරුණු හෝ අතපසුවීම්, තමන්ගේ දැනුම ප්‍රකාරව සඳහන් නොවන බවත් සහතික කොට ප්‍රකාශ කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අයිකනික් ට්‍රස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂ.

*මෙම සංශෝධනය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2024 නොවැම්බර් 06 වැනි දින අනුමත කරන ලද අතර 2024 නොවැම්බර් 12 වැනි දින ප්‍රසිද්ධ කරන ලදී.*

12 - 419

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.